***<u>ආගමක් හෝ විශ්වාසයක් දැරීමට ඇති නිදහස උදෙසා සමාවදීම , ඉවසීම හා විශ්වාසය යනාදී මානුශිය ගුණාංග</u>***

*මිනිසුන් වශයෙන් අප සියලු දෙනා යම් කිසි ආගමක්* අදහනු ලබනවා. බුදුදහම , කතෝලික දහම , ඉස්ලාම් දහම , සහ දේව වන්දනාමාන හා ඇදහිලි අප රට තුල වඩා ප්‍රචලිත ආගම් ලෙස සැලකිය හැකිය. නමුත් අප උපතේ සිට විපතට යන තෙක්ම අප විසින් යම් කිසි ආගමක් අදහනු ලබන්නේ අපගේ ඊළඟ භවයේ සාර්ථකත්වය උදෙසා හෝ මේ භවයේ සාර්ථකත්වය සඳහාය. නමුත් අප ඉපදීමට පෙර යම් කිසි නිශ්චිත ආගමක කෙනෙකු වී ඉපදෙන්නට ඕනිය කියා කිසිදු මතවාදී අදහසක් අප තුල නැත. යමෙක්ට මේ ලෝකයේ තිබෙන්නාවූ ඕනෑම ආගමක් ඇදහීමට , විවිධ ආගම්වලට ගරු කිරීමට හැකියාව තිබෙනවා. නමුත් සමාජයේ බහුතරයක් පිරිස සිතා සිටින්නේ තමා අදහනු ලබන ආගම පමණක් නිවරදි ලෙසය. එයද යම් ආකාරයකින් සත්‍යයකි. අප සියලු දෙනාටම අපගේ ආගම් පිළිබඳ විශාල අභිමානයක් පවතී. නමුත් කෙනෙකුගේ කැමැත්ත මත ඔහුට හෝ ඇයට වෙනත් ආගමකට ආගමනය වීමට හා එම ආගම පිළිබඳ විශ්වාසයක් ඇති කර ගැනීමට පූර්ණ අයිතියක් හිමි වේ. බුදුදහම අදහන අයට ඉස්ලාම් ධර්මය ඇදහීමට නොහැකිය, ඉස්ලාම් ධර්මය අදහන අයට බුදුදහම ඇදහිය නොහැකිය යන මතවාද මඟින් සියලු ආගම්වල පිරිස් සමඟ පවත්නා වූ එකමුතුව බිඳී ගොස් විවිධ ගැටලුකාරී තත්ත්වයන් ඇති විය හැකිය. අප රටක් වශයෙන් ශ්‍රී ලාංකීය නමුත් ආගම්වලට බෙදී ඒවායේ සිටින්නාවූ විවිධ අන්තවාදී අදහස් ඇති පුද්ගලයන් හේතුවෙන් ශ්‍රී ලාංකීය කියන්නාවූ රාමුවද අද වන විට බිඳී යමින් පවතී. බහුතරයක් වශයෙන් පොදුවේ ලාංකීය සිංහල ජනතාවගේ මතය වන්නේ අන්තවාදී පුද්ගලයන් සියල්ල බිහි වන්නේ ඉස්ලාම් ධර්මය තුළින් බවයි. එය මා දකිනා ලෙස මතයක් පමණි.

බුදුදහම විකෘති කරමින් ධර්මය ප්‍රචාරය කරන, කාන්තාවන් හා විවිධ සබදතා පවත්වන ස්වාමීන් වහන්සේ ලා ආදිය මා දකින්නේ බෞද්ධ අන්තවාදීන් ලෙසය. ඉන් බොහෝ සෙයින් අන්තවාදී වන්නේ බුදුදහම ආරක්ෂා කිරීමේ අරමුණින් බුදුදහම විකුණාකන , තම පෞද්ගලික සුභසාධය වෙනුවෙන් සිටින්නාවූ පුද්ගලයන්ය. ආගමක් අප ඇදහිය යුතු වන්නේ අපගේ පිරිසිදු චේතනාවන්ගෙනි. අන්තවාදී යැයි සමාජය විසින් හංවඩු ගසන මුස්ලිම් අපේ සහෝදර ජනතාව ගැන මා දකින්නේ මෙලෙසය. ඔවුන්ගෙන් ඇතැම් පිරිස් තුල අන්තවාදී සිතුම් පැතුම් ඇති බව පිළිගැනීමට පුළුවන. නමුත් ඉන් කියවෙන්නේ නැහැ සමස්ථ මුස්ලිම් ජනතාව අන්තවාදී බව. නමුත් ඔවුන් ඔවුන්ගේ ධර්මය කෙරෙහි කොතරම් ලැදියාවක් තිබෙනවාදැයි මම මෙන්ම ඔබත් හොඳින් දන්නා කරුණකි. අප සියලු දෙනාට තමාට කැමති ආගමක් ඇදහීමට පූර්ණ නිදහස තිබෙනවා. එයට යම් කිසි කෙනෙකු හෝ පුද්ගලයෙක් විරුද්ධවනවා ද ඉන් පෙනී යන්නේ ඔවුන්ගේ නූගත් බවයි. වෙනත් ආගමක් පහතට හෙලා කතා කරන විට කොන්දක් තියෙන පුද්ගලයෙකුට එයට අනුබල දීමට නොහැකිය. එයයි සැබෑම මනුෂ්‍යත්වය. අප සිංහල : බෞද්ධ , දෙමළ : හින්දු , මුස්ලිම් : ඉස්ලාම් , කතෝලික : ක්‍රිස්තියානි ලෙස වෙනම වෙන් වූවාට අප සියලු දෙනාම මිනිසුන්ය. බුදුදහම අදහන බොහෝමයක් දෙනා දේවාල වලට ගොස් විවිධ ආකාරයේ හේතූන් උදෙසා භාරහාර වෙමින් දෙවියන්ට පූජා පවත්වනවා. මෙයින් ගම්‍ය වන්නේ බෞද්ධ ජනයා තුල තිබෙන්නාවූ දේව සංකල්පයට ඇති විශ්වාසයයි. ඉන් බෞද්ධ බොහෝ දෙනෙකුගේ විවිධ කරදර , උවදුරු සඳහා සහනයක් ලැබී ඇති බව නොවනුමානය.

ආගමික මතවාද උග්‍ර ලෙසම කරලියට පැමිණෙන්නේ 2019. 04. 21 දින ලංකාවේ විවිධ කතෝලික දේවස්ථාන හා සංචාරක ස්ථාන කිහිපයක් ඉලක්ක කරගත් පාස්කු ප්‍රහාරය සමඟය. මෙදින ප්‍රහාරයෙන් පසුව සමාජයට විශාල වශයෙන් ප්‍රශ්න රාශියක් පැන නගින්නට විය. ඉන් මුස්ලිම් ජනතාව කෙරෙහි අනෙකුත් ජනතාව සැකයෙන් බැලීමට පුරුදු වූහ. සිංහල පුද්ගලයාට , ක්‍රිස්තියානි පුද්ගලයාට මුස්ලිම් පුද්ගලයන් වෛර කලා. මුස්ලිම් පුද්ගලයාට සිංහල , ක්‍රිස්තියානි පුද්ගලයන් වෛර කලා. මුස්ලිම් ජාතිය තුල ජීවත් වන සුළු අන්තවාදී පිරිසක් හේතුවෙන් සමස්ථ මුස්ලිම් ජනතාවම සැක කරන තත්ත්වයට අප පත් වූවා. නමුත් අතීතයේ මේ සිංහල - මුස්ලිම් කියන ජාතීන් දෙකම කොතරම් සහයෝගයෙන් ජීවත් කියන කරුණට උදාහරණයක් දක්වන්න මම කැමතියි. අතීතයේ ශ්‍රී පාදය වන්දනාමාන කිරීම සඳහා සිංහල ජනතාව වගේම මුස්ලිම් ජනතාවද සහභාගී වුණා. වර්ථමානයේද ඇතැම් අවස්ථාවල මුස්ලිම් ජනතාව ශ්‍රී පාදය වන්දනාමාන කිරීම සඳහා එක්වනවා. ලෝකයේ විශාලතම මුස්ලිම් රාජ්‍යය වන්නේ ඉන්දුනීසියාවයි. එමෙන්ම ලෝකයේ විශාලතම බෞද්ධ විහාර සංකීර්ණයක්ද මෙම ඉන්දුනීසියාවේ පිහිටා තිබෙනවා. මෙය ආගම් අතර අන්‍යොන්‍යය අවබෝධයට හොඳම උදාහරණයකි. අප රටේ වසර 2500 ක අතීතයක් හිමි බුදුදහමක් පැවතෙනවා. බුදුදහමේ මූලික දේ වන්නේ සියලු සත්ත්වයාට අනුකම්පා කිරීමය. ආගම් වලට අගෞරව කරමින් , අපහස කරමින් , නිග්‍රහ කරමින් බුදුදහමේ එන යම් යම් කාරනා ද අප විසින් උල්ලංඝනය කරනු ලබනවා.

අප හා හින්දු ආගම තුල ඇති බැදීමට හොඳම උදාහරණය වන්නේ මහනුවර දළදා පෙරහැරට සතර දේවාල පෙරහැරද එකතු කර ගැනීමය. එමෙන්ම සිංහල හා හින්දු අලුත් අවුරුද්ද තවත් උදාහරණයක් ලෙස ගැනීමට පුළුවන. මෙවැනි දේ වලින් අපගේ සියලු ආගම් අතර තිබෙන්නාවූ ජාතීමය බැදීම ඉස්මතු වෙනවා. එමෙන්ම සිංහල ජනතාවට පුළුවන් වෙනත් ආගම් වල පොත්පත් කියවලා තේරුම් අරන් ඔලුවේ මෙතෙක් කල් හදාගත්ත රාමුව නිවරදි නොවන බව වටහා ගන්න. එමෙන්ම අනිත් ආගම්වල අයටද විවිධ ආගම් පිළිබඳව ගවේෂණය කල හැකිය.

අප එක් ආගමක් අදහනවා නොව අනිත් ආගම් ගවේෂණය කර එම ආගම්වල ලබාදිය යුතු ගෞරවය ලබා දිය යුතුය. වෙනත් ආගමකට වැරැද්දක් ඉදිරිපත් කිරීමට පෙර අප මුලින්ම අපගේ ආගම පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් කල යුතු වෙනවා. ඉන් පසු වෙනත් ආගම්ද ගවේෂණය කල පසු එහි යම් ගැටලුවක් තිබේනම් ඔහුට හෝ ඇයට විවේචන ඉදිරිපත් කල හැකිය. සියලු ආගම්වල උගන්වනු ලබන්නේ එකම දේමය. පුද්ගලයෙකු කුමන ආගමක වුවත් එම ධර්මය ඔහු හෝ ඇය විසින් තේරුම්ගන්නා ලබන ආකාරය මත එම පුද්ගලයා අන්තවාදී හෝ අන්තවාදී නොවීම යන්න තීරණයවනවා. එක්ව ගමනක් යෑමට නම් අප සියලු දෙනා මෙවැනි ප්‍රාථමික අදහස් බැහැරලා බුද්ධිමත් ලෙස කටයුතු කල යුතුය. තමාට කැමති ආගමක් අදහාගෙන අන් අයට කරදරයක් නොවන ලෙස ජීවත් වීමයි අප ජීවත්ව සිටිය යුතු කාලය තුල කල යුතු වන්නේ.

- සම්පූර්ණ නම :  සමන්තිකා ආසිරි වර්ණපුර
- වයස් කාණ්ඩය :  16- 29 අතර (අවුරුදු 20)
- විද්‍යුත් ලිපිනය :
- හැඳුනුම්පත් අංකය :
- නිර්මාණ ලබා ගන්නා අවසන් දිනට වයස :  අවුරුදු 20